ලෝක ව්‍යාප්ත වසංගතයක් බවට පත්ව ඇති කොවිඩ්-19 මගින් ආරක්ෂා වීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ගයන් සම්බන්ධයෙන් ජනතාව දැනුවත් කිරීම, කොවිඩ්-19 මර්දනය සඳහා මාධ්‍යයන්ට දායක විය හැකි ආකාරයකි. එහි විවාදයක් නොමැත. කෙසේ වෙතත්, එසේ ජනතාව දැනුවත් කිරීම සඳහා ඇතැම් මාධ්‍ය මගින් ගනු ලබන ක්‍රියාමාර්ගයන් ඔස්සේ ජනතාවගේ පුද්ගල ගරුත්වයත්, පෞද්ගලිකත්වය සඳහා ඇති අයිතියත් උල්ලංඝනය වන්නේ නම්, එය ගැටළුවකි.

මේ සඳහා උදාහරණ ලෙසින් හිරු ප්‍රධාන ප්‍රවෘත්ති විකාශය (10/25) සහ රූපවාහිනී සිංහල ප්‍රවෘත්ති විකාශය (10/25) ඔස්සේ වාර්තා වූ ඇතැම් රූප රාමු දැක්විය හැක. මෙහිදී අදාළ නිවේදකයින් විසින් මුඛ ආවරණ හරි හැටි පැළඳ නොමැති අයවලුන්ව ප්‍රශ්න කරන අතර, එම පුද්ගලයින්ගේ අනන්‍යතාවය සැඟවීමකින් තොරව දක්වයි. මෙසේ මාධ්‍ය මගින් පොදු යහපත පෙරට තබා, පුද්ගලයින්ගේ පෞද්ගලිකත්වයට ඇති අයිතිය සහ පුද්ගල ගරුත්වය උල්ලංඝනය කිරීම සාධාරණීකරණය කළ හැකිද? පුද්ගල ගරුත්වය ආරක්ෂා කරමින් මෙම දර්ශන ඉදිරිපත් කිරීමට නොහැකිද?

**#COVID19 #Media #MoH_SriLanka #MediaEthicsSL #lka #TVNews #Coronavirus #TV # Rupavahini #HiruTV**